DOI: 10.31357/fhssmst.2005.00057

# "සබරගමු සම්ප්‍රදායේ ශාන්තිකර්මයන්හි පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ"

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ (ලියාපදිංචි අංක GS/HU/1698/2002 නාට්‍ය හා රංග කලාව) ශාස්ත්‍රපති උපාධිය සඳහා වූ මෙම නිබන්ධනය මාගේ ස්වාධීන නිබන්ධනයක් බවත් උපදේශක මහත්මාගේ උපදෙස් අනුව මා විසින් ලියන ලද බවත් සහතික කරමි.

..............................

සන්ධ්‍යා පී. පොඩිතිලමේ

ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක.

GS/HU/1698/2002

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා (ලි.ප අංක GS/HU/1698/2002 නාට්‍ය හා රංග කලාව ) ඉදිරිපත් කෙරෙන "සබරගමු සම්ප්‍රදායේ ශාන්තිකර්මයහි පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ" නම් වූ මෙම නිබණ්ධනය ස්වාධින නිබන්ධනයක් ලෙස මාගේ උපදෙස් වලට යටත්ව ලියන ලද බව සහතික කරමි.

..............................

මහාචාර්ය තිස්ස කාරියවසම්


උපදේශක

# සබරගමු සම්ප්‍රදායේ ශාන්තිකර්මයන්හි පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ



විභාග අංකය 0046
ලියාපදිංචි අංකය GS/HU/1698/2002
සන්ධ්‍යා පී පොඩිනිළමේ
නාට්‍ය හා රංග කලා පාඨමාලාව
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ

# සබරගමු සම්ප්‍රදායේ ශාන්තිකර්මයන්හි පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ



සන්ධ්‍යා පී පොඩිනිළමේ
නාට්‍ය හා රංග කලා පාඨමාලාව
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ

පිදුම

නාට්‍ය හා රංග කලාව විෂයෙහි
පශ්චාත් උපාධි පාඨමාලාවක්
ආරම්භ කරමින්
එකී විෂය ක්ෂේත්‍රයෙහි
ප්‍රගමණය උදෙසා
තරුණ ශිල්පීන් යොමු කරනු වස්
ඇවැසි නිර්මාණාත්මක පරිසරයක්
මෙන්ම
පර්යේෂණාත්මක සාහිත්‍යයක්ද
ගොඩ නැගීමේ
මහඟු ජාතික මෙහෙවරෙහි
ඇප කැපව වෙහෙසෙන
මහාචාර්ය තිස්ස කාරියවසම්
මැතිඳුන්
වෙත
බැති පෙමින් පුදමි.



## අනුමෝදනාව

නාට්‍ය හා රංග කලාව පශ්චාත් උපාධි පාඨමාලාවේ පර්යේෂණ නිබන්ධනයක් ලෙස මෙම කාර්ය ඉටු කිරීමේදී අදාල විෂය ක්ෂේත්‍රය පිළිබද ගැඹුරින් හැදෑරිමටත් නව කරුණු ගවේශනයට සහ විමර්ෂණයටත් නිතැතින් යොමු විම හේතු කොට ගෙන සුවිශාල දැනුම් සම්භාරයක් ලබා ගැනිමටත් තත් විෂය සම්බන්ධ අත්දැකිම් සමුදායක් විෂය කටයුතු සඳහා එක්කරගන්නටත් අවස්ථාව ලැබුනි.

මෙම පාඨමාලාව අරඹමින් අපට එම අවස්ථාව ලබාදුන් සහ මෙහි උපදේශක ලෙසමෙවැනි කටයුත්තකට යොමු කොට උපදෙස් දෙමින් දිරිමත් කළ අප මාහාචාර්ය තිස්ස කාරියවසම් මහතාණන් වෙත භක්ති පූර්වක හෘදයාංගම ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

සබරගමු ශාන්තිකර්ම වල එන පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ යන තේමාව යටතේ කරුණු එක් කිරීමෙදී තත් විෂය පිළිබද ප්‍රායෝගික අත්දැකීම් බහුල ශාස්ත්‍රධරයකු වන ආචාර්ය ලයනල් බෙන්තරගේ මහතාගෙන් ලද මග පෙන්විම ඉතා අගයමි. එමෙන්ම අපලත් තොරතුරු අතර වූ බොහෝ දොස් නිවැරදි කරලමින් එමෙන්ම අනන්‍යතාවයන් හා සුවිශේෂතාවයන් සියුම් ලෙස පෙන්වා දෙමින් නොනැවතුණු එතුමාණෝ ඇතැම් අත් පිටපත්ද සොයා දෙමින් කළ උදාර උපකාරය බැති සිතින් සමරමි.

ජ්‍යෙෂ්ඨ කවිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර මහතා මාගේ මුල්ම සබරගමු නර්තන ගුරුවරයා විය. එතුමාගෙන් ලද මහඟු දැනුමත් මේ කාර්යයේදි ලත් උපකාරයත් බැතියෙන් සිහිපත් කරන අතර ප්‍රසංග කලාවේදි පාරම්පරික දැනුම ඊට අනුගත කරගන්නා අයුරු පිළිබඳව එතුමාගෙන් ලද අත්දැකිම් ඉදිරියටත් ප්‍රයෝජනවත් වන බව කිව යුතුය.

රත්නපුර සිවලි මධ්‍ය මහා විදාලයේ නර්තන උපදේශක ශාන්ත දිසානායක මහතා අදාල විෂය කෙෂ්ත්‍රය පිළිබඳ ප්‍රවිණයකු ලෙස පමණක් නොව

එකී දැනුම නොමසුරුව ලබා දෙමින් ගැටළු තැන් නිරාකරණය කරමින් විෂය පිලිබඳ ප්‍රවීණ ශිල්පීන් හා සම්බන්ධ කර දෙමින් කළ උපකාරයට පින්සිදු වේ. රත්නපුර හංගමුව දවුල් වාදන ශිල්පී පී.පි චන්ද්‍රදාස සහ සිරිපාල ගමගේ මහතාටත් තුති.

ප්‍රවීන වාදන ශිල්පී බබානිස් ගුරුතුමාටත් කරපිංචේ ප්‍රවීන නර්තන ශිල්පී ඩී.පී. පුංචි නිළමේ මහතාටත් ඔවුන් සතු දැනුම හා අත් පිටපත් ඇසුරින් ලබාදුන් අවබෝධයට ස්තුති කළ යුතුය.

අපගේ ඇඳුරුතුමකු ලෙස ඔවුන් සතු අත්පිටපත් පවා නිදර්ශන ලෙස ඉදිරිපත් කරමින් සිය දැනුමින් අප පෝෂණය කළ නැසීගිය කලාගුරු ආර්.පී පොඩි මහත්මයා ගුරු පියාණන්ගෙන් ලැබූ දැනුමද මේ කටයුත්තේදි ප්‍රයෝජනවත් වු බව බැතියෙන් සමරමි.

පුස්තකාල පරිහරණයේදි සහය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලයටත්, සෞන්දර්ය අධ්‍යයන ආයතන පුස්තකාල කාර්ය මණ්ඩලයටත් අත්තිඩිය ප්‍රජා මණ්ඩල පුස්තකාල කාර්ය මණ්ඩලයටත් කෘතඥ වෙමි.

මාගේ අපහැදිලි අත් පිටපත් පැහැදිලිව සකස් කර දෙමින් නිදිවරා උපකාර කළ ශිරෝමි එදිරිසිංහ සිසුවියටත්, හසලි නිශාදිටත් තනුජා ධර්මපාලටත් පරිගණක අක්ෂරයෙන් සහය දුන් විජේරාම සදර්න් කොමියුනිකේෂන් ආයතනයේ කාර්ය මණ්ඩලයටත් ස්තුතියි.

මෙහි බොහෝ කරුණු පුරණය කිරිමට ස්වකීය ප්‍රායෝගික අත්දැකීම් එක්කර දෙමින් පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ විෂයන්හි අවශ්‍ය චිත්‍ර සටහන් නිර්මාණය කර දෙමින් ශාස්ත්‍රීය කටයුතු වලදි ගෘහණියකව මගෙන් ඉටු විය යුතු යුතුකම් ඉවසා සිටින දයාබර සැමියා රම්‍යවර්ධන පොඩිනිළමේ සහ ආදරණීය දරු දෙපළ අභිත් පුතු සහ කුළුණු දියණියටත් අදරින් සමරමි.



# පටුන


පිදුම

අනුමෝදනාව

පෙළගැස්ම

මූලාශ්‍ර හා ක්‍රමවේදය

හැඳින්වීම

## 1 පරිච්ඡේදය

සබරගමුවේ ඓතිහාසික හා භූගෝලීය පසුබිම
සබරගමුවේ ශාන්තිකර්ම
සබරගමු නර්තනය

## 2 පරිච්ඡේදය

සබරගමු ශාන්තිකර්මයන්හි පසුතල සැරසිලි හා රංග භාණ්ඩ
මඩු බැඳීම
පත්තිනි තොරණ දෙවොල් තොරණ
නුගේ සැහැල්ල
කුමාර වීදිය
මල් යහන් සහ පිදේනි තටු

## 3 වන පරිච්ඡේදය

බලි සංකල්ප
බලි ශිල්ප විධි හා ඇඹීම
දරහැව
රංග භාණ්ඩ භාවිතය

සමාලෝචනය






# හැඳින්වීම

සබරගමු නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මයන්හි පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ පිළිබඳව විමසීම මෙම නිබන්ධනයේ අරමුණයි. සබරගමුව යනු ශ්‍රී ලංකාවේ සුවිශේෂ භූමි ලක්ෂණ වලින් සුසැදි මධ්‍යම ප්‍රමාණයේ කඳු සහිත ප්‍රදේශයකි. මෙම භූමි කලාපය තුළ වූ ප්‍රදේශයේ බිහිව ව්‍යාප්තව පෝෂණය වී තිබෙන්නා වූ නර්තන සම්ප්‍රදාය එනමින් හඳුන්වනු ලැබේ.සබරගමු නර්තන සම්ප්‍රදායේ එන ශාන්තිකර්ම බොහෝ ගණනාක් අත. මේ ශාන්තිකර්ම යකුන්, දෙවියන් හා ග්‍රහයින් උදෙසා කරන ශාන්තිකර්ම ලෙස මූලිකව බෙදීමකට ලක් කළ හැකිය.

වර්තමානය වන විට මෙම ශාන්තිකර්ම බොහොමයක් දක්නට නොලැබෙන අතර සුලභව දැකිය හැක්කේ කිහිපයක් පමණි . එනම් කිරිමඩුව, පහන් මඩුව, දෙවොල් මඩුව, ගම් මඩුව, ගිනි මඩුව, පූනා මඩුව, දාන මඩුව, පිදුම් මඩුව, හැල්ලුම් මඩුව ආදි වශයෙන් විශාල ප්‍රමාණයක් පැවතුන අතර සන්නි යකුම, ගොපලූ සමයම, කුමාර සමයම, මහසොහොන් සමයම යනාදි යක්ෂයින් වෙනුවෙන් කෙරෙන ශාන්තිකර්ම ගණනාවක්ද වේ.

මීට අමතරව සබරගමුවට ආවේණිකූ බලි තොවිල් රාශියක්ද දක්නට ලැබේ. කෙසේ වුවත් අද වන විට මින් බොහෝ අංගයන් ප්‍රායෝගිකව දක්නට නොහැකි තත්වයක් උද්ගතව ඇත. ශිල්පීන් සතු අත්පිටපත් වලට හා ඔවුන්ගේ මතකයන්ට පමණක් සීමා වි ඇති මෙකී අංගයන් බොහෝ වෙනස්කම් වලටද බඳුන් වී ඇති බව ඔවුහු පිළිගනිති.

කෙසේ වෙතත් පොදුවේ ගත් කල මිනිසුන් තම තමන්ගේ දෛනික පැවැත්මේදි මුහුණ පාන්නා වූ විවිධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දීමේ ශක්තියත් ආරක්ෂාවත් විශ්වාසයත් පතා විවිධ වූ බලවේගයන්ට කරන්නා වූ පුද පූජාවන් මේ ශාන්තිකර්මයන්ට මුල්වී තිබේ. භාව ප්‍රකාශයන් හා ඒ ඒ ප්‍රස්තුත දෙවි දේවතාවුන් හෝ යක්ෂ ප්‍රේතාදීන් පිළිබඳව කියවෙන සාහිත්‍යන්ටත් අනුව නිර්මාණය වූ අංගචලනය පසු කලෙක නැටුමේ රංග රටාවන් බවට සංවර්ධනය

වී ඇති අයුරුත් පූජා භාණ්ඩ ලෙස භාවිතා කළ ද්‍රව්‍ය පසු කලෙක රංග භාණ්ඩ ලෙස භාවිතා වී ඇති අයුරුත් හොඳින් විමර්ශණය කිරීමේදී පෙනී යයි. මේ රංග භාණ්ඩ භාවිතය ඇතැම් විට නාට්‍යාංගයේ සංඥා නාමයටද එකතු වී ඇති අයුරු තැඹිලි පාලිය දළු, මුර පාලිය ආදියෙන් තහවුරු වේ.

එමෙන් පුද පූජා කිරීමේදී පරිසරය පිරිසිදු කොට කොඩිවැල් ආදියෙන් සරසා මල් පහන් සුවඳ දුම් දල්වා මවනු ලබනු පූජා පරිසරයම රංග භූමි අලංකරණය නැතහොත් රංග පසුතලය බවට පත් වී ඇති අයුරු දැක ගත හැකිය. මෙහිදී මෙම මූලික ස්වරූපයන් තවමත් දැකිය හැකි වුවද ඉතා සිත්ගන්නා සුළු අයුරින් සංවර්ධනයට ලක්ව ඇති අයුරු පෙනේ.

මේ සඳහා භාවිතා කොට ඇත්තේ සොබාදහමෙන් සපයා ගන්නට හැකි හා විවිධාකාර සැරසිලි සඳහා යොදා ගැනීමේ ප්‍රවණතාවයක් ඇති ගොක් කොල, කෙසෙල් පතුරු, හබරල කොළ ආදි අමු ද්‍රව්‍යයන්ය.

මේ අමුද්‍රව්‍ය භාවිතා කොට කළ හැකි සැරසිලි වල සීමාවන් මනාව දැන හඳුනාගෙන හැසිරවීමත් අවැසි තැනට නිසි දේ තෝරා බේරා ගෙන නිසි අන්දමින් යොදා ගැනීමත් යන කළමණාකරණ සංකල්පය නිසඟ ශිල්ප ඥානයත් සමඟ එක්තැන් කර ගැනීමත් පිරිණත ශිල්පියකුගේ ලක්ෂණ විය.

ඒ ඒ ශාන්තිකර්මයන්ට විශේෂ වූ සැරසිලි කර්ම ඇතත් මේ සියල්ල එක් කොට සැලකීමේදී අපට කිසියම් වර්ගීකරණයකට ලක් කිරීමට පුළුවන. ඒ විදි තොරණ් මල් යහන් පිදේනි තටු හා වෙනත් සැරසිලි ආදි වශයෙනි. මේ අංගයන් සැලසුම් කිරීමේ, සැකිලි තැනීමේ, සැරසිලි කිරීමේ හා භාවිතයේ ද සමාන තත්වයන් දැකිය හැක. එසේම තෝරාගනු ලබන අමුද්‍රව්‍ය භාවිතයේදී ද ඇත්තේ සමාන වූ ක්‍රියාදාමයකි.

රංග භාණ්ඩ පරිහරණයේදී ද එසේමය. මේ නිසා මෙකී පසුතල නිර්මාණ හා රංඝ භාණ්ඩ පිළිබඳව අධ්‍යනය කිරීමේදී පහන් මඩුවේත් දෙවොල් මඩුවේත්

කිරි මඩුවේත් එන මල් යහන් හෝ තොරණ් වල දක්නට ලැබෙනුයේ ඒකාකාර වූ නිර්මාණාත්මක ක්‍රියා දාමයකි.

පූජා රටාවේදී ප්‍රමාන තිරණය කිරීමේදි හා භාවිතයේදි පමනක් යම් යම් වෙනස්කම් දක්නට ලැබේ.

රංග භාණ්ඩද එසේමය. යකුන් හෝ දෙවියන් ග්‍රහයින් යනාදි වශයෙන් පුද ලබන අවස්ථාවන්හිදි ඒ ඒ පුද ලබන්නාගේ ස්වභාවය අනුව පූජා වස්තු තෝරා ගැනිමේ පූජා පැවැත්වීමේ වෙනස්කම් මිස පිදේනි තටු හෝ මල් යහන් තැබිමේදි හා සැරසිලි කැරීමේ ක්‍රම වේදයන්හිදි සැලකිය යුතු වෙනස් කම් දැකිය නොහැක.

තත් ශිල්පයෙහි නියතු ඇඳුරන් කිහිප දෙනෙකු සමගම කළ කතා බහේදි අපට පසක් වුයේ ඒ ඒ පුද්ගලයින් විසින්ම පෞද්ගලිකවම ගොඩනඟා ගත්තා වූ ශිල්ප ක්‍රම මත පිහිටා මෙම ක්‍රියා වලිය සිදු කරන බවකි.

මේ නිසා එක් ශාන්තිකර්මයක් එනම් පහන් මඩුවක් ගත හොත් එහි එන තොරණ් නිර්මාණයේ ශිල්ප ක්‍රම හා සැරසිලි රටා මෙන්ම පාදක සෙසු සංකල්ප බොහොමයක් අනෙකුත් රංග සැරසිලි කෙරෙහිදි එක සේ බලපායි.

එක් එක් ශාන්තිකර්මයේ තොරණ් පිළිබඳව වෙනම සාකච්ජා කිරිම එකම දේ නැවත නැවතත් ප්‍රකාශ කිරීමක් වනු ඇත. මේ නිසා සුලභව සිදු කෙරෙන්නා වූ පහන් මඩුව හා කුමාර සමයම මහ සොහොන් සමයම යන ශාන්තිකර්ම පාදක කොට ගෙන ඒවායේ එන සැරසිලි අංග පිළිබඳව සාකච්ජා කිරීම මෙහිදි සිදු කරමි.

රංග භාණ්ඩ පිළිබඳවද මෙම පදනමේ සිට කරුණු දැක් වූ බව අවධානයට ලක් කරනු කැමැත්තෙමි.

එසේ සබරගමු ශාන්තිකර්මයන්ට ආවේණික වූත්, සුවිශේෂ සැරසිලි කර්ම ලෙස හඳුනාගන්නාවූත් සැරසිලි අංග පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළෙමි.

හැකිතාක් දුරට අදාළ රූප සටහන් ඉදිරිපත් කිරීමේදී එම රූප සටහන් ඊට අදාල වූ විස්තරයට සමගාමිව ස්ථාන ගත කිරීමටද උත්සහ ගනිමි. ඇතැම් තැනෙක විස්තර කෙරෙන නිර්මාණයේ රූප සටහනද එක්ව සන්සන්ධනාත්මකව විචාරයට ලක් කිරීම තුළින් වඩාත් පැහැදිලි අවබෝධයක් ලැබිය හැකිය. යන විශ්වාසය මත එසේ කළෙමි.

මෙබඳු වූ අධ්‍යනයකින් නොනැවති එකී සොයා ගැනිම් හා ස්වභාවයන් පුනර් නිර්මාණය කිරීමට හැකිද නැතහොත් නූතන භාවිතයට අදාල කර ගැනිමට හැකිද යන්න සොයා බැලිම ප්‍රායෝගික වූත් ඵලදායක වූත් ව්‍යායාමයක් සේ සිතමි.

සෞන්දර්ය අධ්‍යයන ආයතනයේදී සබරගමු නර්තන විෂය හදාරන අවධියේදී කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාරයන් විසින් එබඳු වූ සොඳුරු අත්දැකීම් රැසක්ම විඳ ගන්නට අවස්ථාව ලබා දෙන ලදි. "සමන් පහන, සමන් සේසත්, ප්‍රසංගයන්හිදී සබරගමු ශාන්තිකර්ම පසුරු කොට ගෙන නූතන ප්‍රසංග වේදිකාව තරණය කිරීම අපූරු වූත් ඓතිහාසික වූත් අවස්ථාවක් ලෙස එවකට සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂව සිටි මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ පැසසුමට ලක් වූ අයුරු පහන් සිතින් සැමරිය හැකිය.

නර්තනය හා නාට්‍යකරණය හා රංග කලාවද පාසැල් විෂය මාලාව තුළ ඉගැන්වීමේ යෙදෙන විට අප අධ්‍යයනට ලක් කළ පසු තල හා රංග භාණ්ඩ සංකල්ප ඉතා හොඳින් නූතන ප්‍රසංග වේදිකාවට බද්ධ කර ගත හැකි වීම සතුටට කරුණකි. මේ අනුව බලන කල්හි ප්‍රායෝගික භාවිතයට ලක් කළ හැකි විෂය පථයක් අධ්‍යනය කරන්නට සලස්වා නොපමාවම එහි පලදායික ලෙස නිරත වන්නට ඉඩ සැලසෙන අයුරින් අප හැම යොමු කිරීම ගෞරවාදරයට හේතු විය හැකි කරුණක් ලෙස සඳහන් කරනු කැමැත්තෙමි.



# පරිච්ඡේදය 1

## සබරගමුව ඓතිහාසික හා භූගෝලීය පසුබිම.

අද්‍යතන සබරගමුව යනු රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කය ඇතුලත් ප්‍රදේශයයි. මෙම ප්‍රාදේශීය සීමාවන් අතීතයේ සිට විවිධ වෙනස්කම් වලට බදුන් වූ බැව් ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලි වේ. ශ්‍රී ලාංකීය භූගෝලීය පිහිටීම් හා සලකා බැලීමේදී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයට බරව බස්නාහිර- වයඹ- දකුණ- ඌව පළාත් වලට මායිම්ව සබරගමුව පළාත පිහිටා ඇත. මෙම ප්‍රදේශය සාමාන්‍යයෙන් මුහුදු මට්ටමෙන් අඩි 300 - 1200 අතර වන මැද රට නමින් හැඳින්වෙන භූමි කලාපයට ඇතුළත් වේ. සබරගමුව මෑත අතීතයේ සිට රුහුණු රට හා මායා රට යන කොටස් වලට අයත්ව තිබූ බවට සාධක හමු වේ. මෙම තත්වය ශ්‍රී ලංකාවේ දේශපාලන යුග බෙදීම මත වෙනස් වීම් වලට ලක් වූ බවට තොරතුරු හමු වේ. පසු කලෙක පෘතුගීසි පාලන සමයේ "සපර්ගම්" දිසාවට බස්නාහිර පළාතේ හේවාගම් කෝරළයේ කෑගලු දිස්ත්‍රික්කයේ "දෙහිගම්පල්, පනාවල් ,අටළුගම්" යන කෝරළ 3 ක් කුරුවිට, නවදුන්, අටපලං, කුකුළු, කඩවත් මැද යන කෝරළයන් අයත් වූ බව කිය වේ.

1410 - 62 කෝට්ටේ 6 වන පරාක්‍රමබාහු රජ සමයේ රත්නපුර සිට දෙනවක හරහා බඹරබොටුව තෙක් නව යොදුනක් පමන වූ කුඩා ප්‍රදේශය සබරගමු ප්‍රදේශය ලෙස සබරගමු සමන් දේවාල සන්නසින් හෙලි වේ. 1742-82 කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමයේ කුරුවිට, නවදුන්. අටකලං, මැද, කඩවත් හා කොලොන්න කෝරළ 7 සබරගමු දිශාවට අයත්ව තිබුණි.

කෙසේ වුවද වර්තමාන රත්නපුර ප්‍රදේශය කේන්ද්‍ර කොට ගෙන සබරගමු දිශාවේ සීමා මායිම් ඒ ඒ කාල වකවානු තුළදී ඇත් මෑත් වූ බව පැහැදිලිය. ඒ නිසා සබරගමු ප්‍රදේශය ප්‍රධාන වශයෙන් රත්නපුරය කේන්ද්‍ර කොට ගත් භූගෝලීය පරිසරය පාදක කොට ගොඩනැගුණු සංස්කෘතික කලාපයක් තුළ ස්ථාන ගත වී ඇත. මධ්‍යම කඳුකරයත් වෙරළබඩ තැනිතලාවත් අතර වූ බෑවුම් සහිත මධ්‍යම ප්‍රදේශය උස් කඳු ශිඛරයන්ගෙන් හා ඈතින් ඈතට විහිදී ගිය කඳු වැටි බෑවුම් තැනිතලා නිම්නයන්ගෙන්

ගහන වූ සංකීර්ණ ස්වභාවයක් දරයි. එක් අතකින් සමනල කන්ද ප්‍රධාන ලිහිණි හෙළ, හුණු දිය පර්වතය, දෙතුරුගල කන්ද, රත්කන්ද, ගට්නිතැල්ල, කඳු වැටිත් අනිත් පසින් රක්වාන කඳු වැටියත් බලන - කඩුගන්නාව තෙක් විහිදී ගිය උස් කඳු සහිත නැගෙනහිර දිශාවත් ඌව ප්‍රදේශය දක්වා දිවෙන තැනිතලා සහිත වූ කඳු කරයත් මැදි කර ගත් සබරගමුව දිවයිනේ සුවිශේෂ භූමි ලක්ෂයන්ට උරුමකම් කියයි.

මෙම සුවිශේෂ භූගෝලීය ලක්ෂණ සබරගමුව වටකොට ගත් ආවෘත පවුරක් වැන්න. සමනළ අඩවිය, සිංහරාජ, පලාබද්දල. ගුරුබැවිලාව, කූඩාව ආදි රක්ෂිත වනාන්තර කිහිපයක්ම සහිත වූ සබරගමුව ලංකාවේ ගංඟා බහුතරයකටම උපත ලබා දෙන ජල පෝෂක ප්‍රදේශයකි. තෙත් කලාපීය වෘක්ෂලතා ව්‍යාප්තියක්ද සහිත වූ මෙම භූමි කලාපයේ විශේෂයෙන්ම මැණික්, යපස්, ඉල්මනයිට්, ඩොලමනයිට්, කෙව්ලින්. ආදි විවිධ ඛනිජ වර්ග රැසක් ද අන්තර්ගත වේ. එහෙත් දකුණු දිග ප්‍රදේශයේ ඇඹිලිපිටිය වැනි පළාත් වියළි ශුෂ්ක දේශගුණික තත්වයෙන් යුතු වීමද විශේෂත්වයකි.

සබරගමු නර්තනය පිළිබඳ සලකා බැලීමේදී එහි ඇති සුවිශේෂී අනන්‍යතාවයට මෙම අපූරු භූමි ලක්ෂණ හා බැඳුනු කිසියම් සබඳතාවක් ඇති බවට ඉඟි පලවේ. මෙම සුවිශේෂී භූමි කලාපය සබරගමුව ලෙස නම් ලැබීමද අවධානයට යොමු විය යුතුය.

ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේදී බෞද්ධ සාහිත්‍යයේ එන ඇතැම් කරුණු අමතක කළ නොහැක. බුදුන් වහන්සේ තෙවන වර ලක්දිවට වැඩම කළ විට සමනළ කන්දේ ශ්‍රී පාදය ස්ථාපිත කළ බවත් දිවා ගුහාවේ ගිමන් හල බවත් කිය වේ. මෙම ස්ථානද්වයම අයත් වන්නේ සබරගමුවටයි. සමනළ කන්ද ආශ්‍රිතව නිල්වන් කඳුකරයට ප්‍රධාන වූ සුමන සමන් දිව්‍ය රාජයාට මෙම ස්ථානයන්හි ආරක්ෂාව භාර කළ බවට ප්‍රවාදයක් පවතී. මේ අනුව සුමන සමන් දෙවියන් හා සමනළ කන්දත් ශ්‍රී පාදයත් ජනතාවගේ දැඩි අවධානයට ලක් වේ. එමෙන්ම සමනළ කන්ද ආශ්‍රිතව මෙම ප්‍රවාදයන්ද අනෙක් අතට එහි එන කේතුකාකාර හැඩයත් භූගෝලීය පිහිටීම හා සබැඳි අනෙකුත් අව් වැසි සුළං වැනි සාධකත් පමනක් නොව හිරු එළිය පතිත වීම පවා සමනළ කන්ද ආශ්‍රිතව සුවිශේෂත්වයක් උරුම කොට දී ඇත.

සබරගමුව පිළිබඳ ලිඛිත සාධක පොලොන්නරු යුගයේ රචිත චූලවංශයේ (1164-1194) " රට්ටේච සවරෙ" "සවරග්ගාම රඨස්මිං" යනුවෙන් සබරගමු රට ලෙස සඳහන්ව තිබේ. දඹදෙණි යගයේ රජ කළ 11 වන පැරකුම්බාවන්ගේ තඹ සන්නසකද සබරගමුව ගැන සඳහන් වේ. අනතුරුව කෝට්ටේ යුගයේදී මහනුවර යුගයේදීත් හමුවන විවිධ සන්නස් හා තුඩපත් වල සබරගමුව හා සපරගමුව යනාදී වශයෙන් සබරගමුව නම් වූ මෙම ප්‍රදේශ නාමය තහවුරු කොට තිබේ. කතිකාචාර්ය ගයානි දීපිකා මද්දුමාගේ විසින් රචිත සබරගමුවේ "පහන් මධුයාගය නම් වු ග්‍රන්ථයේ විවිධ සන්නස්හි සබරගමුව සඳහන්ව ඇති ආකාරය පිළිබඳව තොරතුරු එකතුවක් දැක්වේ. (පිටු 33-34-35)

කිරි ඇල්ලේ ඥාන විමල හිමියන්ට අනුව සබරගමුව හා සපරගමුව යන නම් දෙකම මෙම ප්‍රදේශය වෙනුවෙන් භාවිත කර ඇති බව පැහැදිලිය. මැණික්වලට වර්තමානයේදි ද ප්‍රසිද්ධියක් උසුලන සබරගමු ප්‍රදේශය විශේෂයෙන් නිල් මැණික් සඳහා ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ඉසිලූබව පැහැදිලිය. පුරාණ වෙළඳුන්ගේ විශේෂ අවධානය දිනා ගත් වෙළඳ භාණ්ඩයක් වූ මැණික් ග්‍රික්වරු "සෆිරෝස්" යනුවෙන්ද හීබෲවරු "සෆීර්" ලෙසද පර්සියන්වරු "සෆිරස්" ලෙසද ඉංග්‍රිසින් "සෆායා" ලෙසද හඳුන්වනු ලැබේ. ඕලන්ද "සපරගම්" හා ජර්මන් "සපර්ගම්" මැණික් සඳහා ව්‍යවහාර නාමයන්ය.

මේ අනුව පෘතුගිසින්, ඕලන්ද, ඉංග්‍රිසි හා පර්සියානුවන්ද සිය ප්‍රධාන ඉලක්කය කර ගත් මැණික් හැඳින්වූ නම "සෆර්" යන්න මෙම ප්‍රදේශයට භාවිත කිරීම සහේතුකය. තවද වැදි ජනයා අමතන නාමයක් ලෙසද "සබර" යන්න ඇතමුන් හඳුන්වති. කුවේණිගේ දරුවන් වන ජීවහත්ත දිසාලා දෙදෙන පලාවිත් සැඟවී සිටියේ සමනළ අඩවියේ බවත් ඔවුන්ගේ පරපුරෙන් වැද්දන් පැවත එන බවත් ජනප්‍රවාදයේ ඒ. සමනළ අඩවිය ආශ්‍රිත කලාපය සැඟවී දිවි ගෙවීමට අවැසි සියළු අවශ්‍යතාවයන්ගෙන් සම්පූර්ණ බව පැහැදිලිය. ඉදුම් හිටුම්, ආරක්ෂාව, ආහාර පාන යන සියළු අවශ්‍යතා මෙම කලාපය තුළ බහුලය. එසේම අද දක්වාත් වැදි ජනයාගේ වාසස්ථාන ලෙස හඳුනාගත් ගල් ගුහා මෙම ප්‍රදේශයෙන් හමු වේ.

ගිලිමලේ, බඹරබොටුව. කිතුල්ගල. කෙහෙල්ගමුව, කළුගල,කොටියාගල ආදී ගල් ලෙන්ද වැදි පංගුව, වැද්දාගල, වැදිහේන, වැද්දා කන්ද, වැදි කන්ද ආදී ප්‍රදේශ නාමයන්ද මේ බව ප්‍රකාශ කරයි. "සබර" යන නාමයෙන් වැද්දන් හැඳින්වූ අතර රංචු ගැසී ජීවත් වීම ගොමුවක් ලෙස සැලකේ. මේ අනුව "සබරගමුව" යන නාමය ලැබුණු බව මතයකි.

ලංකාවේ ආදි මානවයන්ට අයත් සේ සැලකෙන පාෂාණීභූත ඇටසැකිලි රාශියක් මේ ප්‍රදේශය ආශ්‍රිතව සොයා ගෙන තිබීමද සැලකිය යුතු සාධකයකි. විශේෂයෙන්ම බලංගොඩ මානවයා හා සම්බන්ධ තොරතුරු හා සාධක මෙහිදී අමතක කළ නොහැක. ආසියාතික මානව ශිෂ්ටාචාරයේ මූලසාධක රැසක්ම මෙම සබරගමු ප්‍රදේශයෙන් ලැබී ඇත. බලංගොඩ මැණික් පතලකින් මතු කර ගත් පාෂාණීභූත ඇටකටු හා මෙවලම් අවු 28,000 කට හෝ ඊටත් පෙර යුගයකට හිමිකම් කියයි. බලංගොඩ මානවයාගේ හිස් කබල අවු 31,500 කටත් වැඩියයි සැලකේ. කුරුවිට බටදොඹ ලෙන වසර 16,000 ක්ද කිතුල්ගල වසර 12,500 ක්ද බෙල්ලන්බැඳි පැලැස්ස වසර 6,500 ක්ද පැරණි බව පිළිගැනේ. පැරණි සිරිපා මඟ ලෙස සැලකෙන බුලත්සිංහල, ගවරගිරිය, අයගම, කුරුවිට මාර්ගයේ හමු වූ අසියාවේ අතිවිශාල ගල් ගුහාවක් වූ පාහියන්ගල ගුහාව මෑතකදී හමු වූ සුවිශේෂ ප්‍රාග් ඓතිහාසික ගුහා සංකීර්ණයයි. චීන ජාතික පාහියන් භික්ෂුව චීනයට යන අතරමඟ මෙහි නතරව සිටි බවටද මතයක් පවතී. කෙසේ වුවද සබරගමුව නම් වූ මෙම අපූරු භූමි කලාපය ඓතිහාසික අතින්ද වැදගත් ප්‍රදේශයක් සේ සැලකිය හැකිය.සංස්කෘතික භාෂාවේ දැක්වෙන "සපර" "ශබර" යනුවෙන් දෙවර්ණ කුඩමස්සන් විශේෂයක් රාශි වශයෙන් මෙම ප්‍රදේශයේ ජීවත් වූ බැවින් සබරගමුව යන නමින් හඳුන්වා ඇති බවද පැවසේ. සබර නම් වූ ශාඛ විශේෂ බහුලව තිබීම, ගොමු වශයෙන් පැවතිම සබරගමුව වීමට හේතු වූ බවටද කිරි ඇල්ලේ ඤාන විමල හිමියෝ අනුමාන කරති. කෙසේ වුවද මෙම සපර යන නාමයද මෙහි මුල් රූපය බව පෙනේ. පසුව භාවිතයේ දී සපර, සබර ලෙස වෙනස් වූ බව පිළිගත හැකිය.

සබරගමුව නම් වූ ප්‍රදේශය ආශ්‍රිතව බිහි වී පැතිර පවත්නා නර්තන සම්ප්‍රදාය අප සබරගමු නර්තන සම්ප්‍රදාය ලෙස හඳුන්වමු. භූගෝලීය සාධක පදනම් කොටගෙන සංඥා නාම යොදා ගෙන ඇති සිංහල නර්තන කලාවේ